## ඇමුණුම 1

# ක්ෂේත්‍ර මාතෘ හා ළමා සායනයෙන්/නව දිවි සුව සායනයෙන් පෝෂණ සායනය වෙත යොමු කළ යුතු පෝෂණ ගැටළු

### 1.1 ළදරුවන් හා අවුරුදු 1-5 අතර දරුවන්

ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් ක්ෂේත්‍ර ළදරු ළමා සායනයේ වෛද්‍යවරයා වෙත යොමු කළ යුතු පෝෂණ ගැටළු පහත දැක්වේ. **මෙම දරුවන්ගෙන් ළදරු ළමා සායනයේදී මැදිහත් වීම අපහසු වූ / අසාර්ථක වූ වර්ධන ගැටළු හෝ වෙනත් පෝෂණ ගැටළු ඇති දරුවන් පමණක් පෝෂණ සායනය වෙත යොමුකළ යුතුය.**

| | **දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනට අනුව වර්ධන කලාපය** | **ගැටළුව** |
|---|---|---|
| 1. | වයසට අදාළ බර ප්‍රස්ථාරයේ +2 SD හා -1 SD අතර කලාපයේ (කොළ පාට කලාපයේ) වර්ධනය සිදුවන දරුවන් | • බර <u>අඩුවීමක්</u> හඳුනාගත් වහාම (පළමු අවස්ථාවේදීම)*<br>• වර්ධන රේඛාව කොළ පාට පරාසයේ සිට ලා කොළ පරාසයට/ තැඹිලි පාට පරාසයට ගමන් කිරීම<br>• මැදිහත්වීම් පටන්ගෙන මාසයක් ගියපසු බර වැඩි වීමක් පෙන්නුම් නොකිරීම<br>• ආරම්භයේදී කොළ පාට පරාසයේ ඉහල බර මට්ටමක සිටියත් කලකට පෙර වර්ධනය අඩාල වී දැන් එම අඩු බර තත්ත්වයේම සම්මත රේඛාවන්ට සමාන්තරව වර්ධනය වීම<br>• දීර්ඝකාලීනව වර්ධනය අඩාලවූ දරුවන් (එක ළඟ බර කිරීම් 3කදී) (උදා - පිටින් පැමිණි දරුවන්)*<br>• වර්ධනය අඩාලවීමට හේතුව රෝගයක්/සෞඛ්‍ය ගැටළුවක් වීම හෝ එබඳු ගැටළුවක් ඇතැයි සැක කිරීම<br>• වර්ධනය අඩාල වීමට හේතුව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණියට සොයාගත නොහැකිවීම<br>• හඳුනාගත් හේතුවට ප්‍රතිකාර කිරීමට අපොහොසත් යයි පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනියට හැඟීම<br>• වර්ධනය සාමාන්‍ය පරිදි සිදුවෙමින් පැවති දරුවකුගේ වයසට අදාළ බර වර්ධන රේඛාව සම්මත රේඛාවන් කපාගෙන කෙටි කාලයක් තුල අසාමාන්‍ය ලෙස ශීඝ්‍රයෙන් ඉහල නගින විට** |
| 2. | වයසට අදාළ බර ප්‍රස්ථාරයේ -1 SD හා -2SD අතර කලාපයේ (ලා කොළ පාට කලාපයේ) වර්ධනය සිදුවන දරුවන් | • බර <u>අඩුවීමක්</u> හඳුනාගත් වහාම (පළමු අවස්ථාවේදීම)*<br>• වර්ධන රේඛාව ලා කොළ පරාසයේ සිට තැඹිලි පාට පරාසයට ගමන් කිරීම<br>• ලා කොළ පරාසයේ සිටින දරුවකුගේ බර රේඛාවේ නැග්ම |

| | | |
|---|---|---|
| | | අඩුවීම හෝ එකම බර මට්ටමේ පවතින ආකාරයේ වර්ධනය අඩාලවීමක්<br>• ආරම්භයේදී ලා කොළ පාට පරාසයේ ඉහල බර මට්ටමක සිටියත් කලකට පෙර වර්ධනය අඩාල වී දැන් එම අඩු බර තත්ත්වයේම සම්මත රේඛාවන්ට සමාන්තරව වර්ධනය වීම<br>• වර්ධනය අඩාලවීමට හේතුව රෝගයක්/සෞඛ්‍ය ගැටළුවක් වීම හෝ එබඳු ගැටළුවක් ඇතැයි සැක කිරීම<br>• වර්ධනය අඩාල වීමට හේතුව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණියට සොයාගත නොහැකිවීම<br>• හඳුනාගත් හේතුවට ප්‍රතිකාර කිරීමට අපොහොසත් යයි පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණියට හැඟීම<br>• මැදිහත්වීම් පටන්ගෙන මාසයක් ගියපසු බර වැඩි වීමක් පෙන්නුම් නොකිරීම<br>• දීර්ඝකාලීනව වර්ධනය අඩාලවූ දරුවන් (එක ලඟ බර කිරීම් 3කදී) (උදා - පිටින් පැමිණි දරුවන්)*<br>• වර්ධනය සාමාන්‍ය පරිදි සිදුවෙමින් පැවති දරුවකුගේ වයසට අදාළ බර වර්ධන රේඛාව සම්මත රේඛාවන් කපාගෙන කෙටි කාලයක් තුල අසාමාන්‍ය ලෙස ශීඝ්‍රයෙන් ඉහල නගින විට** |
| 3. | වයසට අදාළ බර ප්‍රස්ථාරයේ -2 SDට පහළ (රතු/තැඹිලි පාට කලාපයන්හි) වර්ධනය සිදුවන දරුවන් | • මෙම දරුවන් (උදා- උපත් බර අඩු දරුවන්, පිටින් පැමිණි අඩුබර දරුවන්) හඳුනාගත් වහාම වර්ධන ඇගයීමක් සඳහා සෞ.වෛ.නි වෙත යොමුකළ යුතුය.<br>• තැඹිලි/රතු පාට පරාසයේ වැඩෙන දරුවකුගේ වර්ධනය අඩාලවීම පෝෂණය සම්බන්ධ ඉතා හදිසි අවස්ථාවක් සේ සලකා වහාම යොමු කිරීම කළ යුතුය.<br>• වර්ධනය සාමාන්‍ය පරිදි සිදුවෙමින් පැවති දරුවකුගේ වයසට අදාළ බර වර්ධන රේඛාව සම්මත රේඛාවන් කපාගෙන කෙටි කාලයක් තුල අසාමාන්‍ය ලෙස ශීඝ්‍රයෙන් ඉහල නගින විට** |
| 4. | වයසට අදාළ බර ප්‍රස්ථාරයේ +2SDට ඉහලින් වර්ධනය වන දරුවන් (දම්පාට කලාපයේ) | • වර්ධන සටහනෙහි දම්පාට පරාසයේ බර පවතින ළමුන් හඳුනාගත් වහාම යොමු කළ යුතුයි** |
| 5. | වයසට අදාළ දිග/උස ප්‍රස්ථාරයේ | • තැඹිලි හෝ රතු පාට පරාසයේ දිග/උස පෙන්වන ළමුන්<br>• දරුවන්ගේ වයසට අදාළ උස දක්වන වර්ධන රේඛාව සම්මත රේඛාවලින් වෙනස් වන්නේ නම් යොමු කළ යුතුයි (වයසට අදාළ දිග/උස රේඛාවේ නැග්ම අඩුවීම හෝ එකම මට්ටමේ පැවතීම හෝ ශීඝ්‍රයෙන් ඉහල යාම). |

| | | |
|---|---|---|
| 6. | දිග/උසට අදාළ බර ප්‍රස්ථාරයේ -2 SDට පහළින් සිටින දරුවන් | • මධ්‍යස්ථ කෘශ බව (තැඹිලි කලාපය -2 SD හා -3 SD අතර)<br>• උග්‍ර කෘශ බව (රතු කලාපය -3 SD ට අඩු) - ක්ෂේත්‍ර සායන භාර වෛද්‍ය නිළධාරි විසින් ඖෂධීය ආහාරය සඳහා විශේෂඥ වෛද්‍ය සායනය වෙත යොමු කිරීම කළයුතුය. |
| 7. | දිග/උසට අදාළ බර ප්‍රස්ථාරයේ +1 SDට ඉහළින් සිටින දරුවන් | • අධිබරට අවදානම (+1 SD හා +2 SD අතර)<br>• අධිබර (+2 SD හා +3 SD අතර)<br>• ස්ථුලතාවය (+3 SD ට වැඩි) - ක්ෂේත්‍ර සායන භාර වෛද්‍ය නිළධාරි විසින් වහාම විශේෂඥ වෛද්‍ය සායනය වෙත යොමු කිරීම කළයුතුය. |
| 8. | | ක්ෂුද්‍ර පෝෂක ඌණතාවයන් ඇතැයි සැකකරන අවස්ථාවල (උදා: විටමින් ඒ ඌණතාවය, රක්තහීනතාවය වැනි) |

* මෙම දරුවන්ගේ දිග/උසට අදාල බර පරීක්ෂා කර බලා ඉහත අංක 6හි පරිදි කටයුතු කළයුතුය.

** මෙම දරුවන්ගේ දිග/උසට අදාල බර පරීක්ෂා කර බලා ඉහත අංක 7හි පරිදි කටයුතු කළයුතුය. රෝගයකින් පසු වර්ධනය අඩාලවූ පසු නිවැරදි මැදිහත්වීම් නිසා ඇතිවන ශීඝ්‍ර වර්ධනය මීට අයත් නොවේ.

යොමු කිරීමේදී දිග/උසට අදාල බර තක්සේරු කළයුතු අවස්ථා -

1 බර අඩුවූ පළමු අවස්ථාවේදීම

2 එක ළඟ බර කිරීම් 3කදී බර වැඩිවීම ප්‍රමාණවත් නොවීම හෝ බර වැඩි නොවීම

3 මධ්‍යස්ථ හා උග්‍ර අඩුබර (වයසට අදාළ බර -2 SDට පහළින් සිටින සියළුම දරුවන්)

4 “අධිබර” (වයසට අදාළ බර ප්‍රස්ථාරයේ +2 SDට ඉහලින් වර්ධනය වන දරුවන්)

## 1.2 පාසැල් දරුවන්

ශරීර ස්කන්ධ දර්ශකය 30ට වැඩි හෝ 17ට අඩු දරුවන් හා උග්‍ර නිරක්තියෙන් පෙලෙතැයි සැකකරන දරුවන් ළඟම දිනයක යෙදෙන කුමන සායනයකදි හෝ වෛද්‍ය නිළධාරියකු විසින් පරීක්ෂා කර විශේෂඥ රැකවරණය සඳහා යොමු කළ යුතුය.

| | වර්ධන කලාපය | ගැටළුව |
|---|---|---|
| 1 | අවු 5-19ත් අතර සෞඛ්‍ය වර්ධන සටහනෙහි වයසට අනුව ශරීර ස්කන්ධ දර්ශකය ප්‍රස්ථාරයේ -2 SDට පහළ (රතු/තැඹිලි පාට කලාපයන්හි) වර්ධනය සිදුවන දරුවන් | කෘෂ බව - මෙවැනි කෘශ දරුවකුට අවශ්‍ය මැදිහත්වීම් සිදුකර මාස 3 කට පසුත් අසාර්ථක නම් |
| 2 | දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි වයසට අනුව ශරීර ස්කන්ධ දර්ශකය ප්‍රස්ථාරයේ +1SD හා +2SD අතර වර්ධනය වන දරුවන් (ලා දම්පාට කලාපයේ) | අධිබර - මෙවැනි අධිබර දරුවකුට අවශ්‍ය මැදිහත්වීම් සිදුකර මාස 3 කට පසුත් අසාර්ථක නම් |
| 3 | දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි වයසට අනුව ශරීර | ස්ථුල බව - මෙවැනි ස්ථුල දරුවකුට අවශ්‍ය මැදිහත්වීම් සිදුකර මාස 3 කට |

| | | |
|---|---|---|
| | ස්කන්ධ දර්ශකය ප්‍රස්ථාරයේ +2SDට ඉහලින් වර්ධනය වන දරුවන් (තද දම්පාට කලාපයේ) | පසුත් අසාර්ථක නම් |
| 4 | | සායනිකව හඳුනාගත් නිරක්තිය - මෙම දරුවන් හඳුනාගත් වහාම රුධිර පරීක්ෂාවක් (FBC – Full Blood Count) සමඟ සායනයට යොමු කල යුතුය. |
| 5 | | වෙනත් ක්ෂුද්‍ර පෝෂක ඌණතාවයන් ඇතැයි සැකකරන අවස්ථාවල (උදා: විටමින් ඒ ඌණතාවය, ගලගණ්ඩය වැනි) |

### 1.3 පාසැල් නොයන අවුරුදු 5-19 අතර දරුවන්

ශරීර ස්කන්ධ දර්ශකය 30ට වැඩි හෝ 17ට අඩු දරුවන් හා උග්‍ර නිරක්තියෙන් පෙලෙතැයි සැකකරන දරුවන් ළඟම දිනයක යෙදෙන කුමන සායනයකදි හෝ වෛද්‍ය නිළධාරියකු විසින් පරීක්ෂා කර විශේෂඥ රැකවරණය සඳහා යොමු කළ යුතුය.

| | වර්ධන කලාපය | ගැටළුව |
|---|---|---|
| 1 | අවු 5-19ත් අතර සෞඛ්‍ය වර්ධන සටහනෙහි වයසට අනුව ශරීර ස්කන්ධ දර්ශකය ප්‍රස්ථාරයේ -2 SDට පහළ රතු/තැඹිලි පාට කලාපයන්හි වර්ධනය සිදුවන දරුවන් | කෘෂ බව - මෙම දරුවන් හඳුනාගත් වහාම වර්ධන ඇගයීමක් සඳහා සෞ.වෛ.නි වෙත යොමුකළ යුතුය. |
| 2 | දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි වයසට අනුව ශරීර ස්කන්ධ දර්ශකය ප්‍රස්ථාරයේ +1SD හා +2SD අතර වර්ධනය වන දරුවන් (ලා දම්පාට කලාපයේ) - | අධිබර - මෙම දරුවන් හඳුනාගත් වහාම වර්ධන ඇගයීමක් සඳහා සෞ.වෛ.නි වෙත යොමුකළ යුතුය. |
| 3 | දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි වයසට අනුව ශරීර ස්කන්ධ දර්ශකය ප්‍රස්ථාරයේ +2SDට ඉහලින් වර්ධනය වන දරුවන් (තද දම්පාට කලාපයේ) | ස්ථුල බව - මෙම දරුවන් හඳුනාගත් වහාම වර්ධන ඇගයීමක් සඳහා සෞ.වෛ.නි වෙත යොමුකළ යුතුය. |
| 4 | | සායනිකව හඳුනාගත් නිරක්තිය - මෙම දරුවන් හඳුනාගත් වහාම රුධිර පරීක්ෂාවක් (FBC – Full Blood Count) සමඟ සායනයට යොමු කල යුතුය. |
| 5 | | ක්ෂුද්‍ර පෝෂක ඌණතාවයන් ඇතැයි සැකකරන |

| | | |
|---|---|---|
| | | අවස්ථාවල (උදා: විටමින් ඒ ඌණතාවය, විටමින් බී ඌණතාවය, ගලගණ්ඩය වැනි) |

## 1.4 පූර්ව ගර්භණී කාන්තාවන්

| | ශරීර ස්කන්ධ දර්ශකය | ගැටළුව |
|---|---|---|
| 1 | පූර්ව ගර්භණී සමයේ ශරීර ස්කන්ධ දර්ශකය 18.5ට අඩු සහ 30 හෝ ඊට වැඩි කාන්තාවන් | නවදිවිසුව සායනයේදී නිර්දේශිත මැදිහත්වීම් සිදු කළද සතුටුදායක බර තත්ත්වයක් පෙන්නුම් නොකරන කාන්තාවන් |
| 2 | | නිවැරදි නොවූ රක්තහීනතාවය |
| 3 | | වෙනත් ක්ෂුද්‍ර පෝෂක ඌණතාවයන් ඇතැයි සැකකරන අවස්ථාවල (විටමින් ඌණතා තත්ත්ව - ඒ, බී, ගලගණ්ඩය වැනි) |

## 1.5 ගර්භණී මව්වරුන් හා මව්කිරිදෙන මව්වරුන්

| | ශරීර ස්කන්ධ දර්ශකය / බර වැඩිවීම | ගැටළුව |
|---|---|---|
| 1 | පූර්ව ගර්භණී සමයේ ශරීර ස්කන්ධ දර්ශකය 18.5ට අඩු සහ 30 හෝ ඊට වැඩි මව්වරුන් | ක්ෂේත්‍රයේදී නිර්දේශිත මැදිහත්වීම් සිදු කළද සතුටුදායක බර තත්ත්වයක් පෙන්නුම් නොකරන මව්වරුන් |
| 2 | ගර්භණී සමයේ බර වැඩිවීම සතුටුදායක නොවන මව්වරුන් | ශරීර ස්කන්ධ දර්ශකයට අනුව ගර්භණී කාලයේ බර වැඩි නොවන මව්වරුන්<br><br>ශරීර ස්කන්ධ දර්ශකයට අනුව බර වැඩි විය යුතු කලාපයෙන් ඉවතට (උඩට/පහලට) යන මව්වරුන්<br><br>ශරීර ස්කන්ධ දර්ශකය 18.5ට අඩු මව්කිරිදෙන මව්වරුන් |
| 3 | | නිවැරදි නොවූ රක්තහීනතාවය |
| 4 | | වෙනත් ක්ෂුද්‍ර පෝෂක ඌණතාවයන් ඇතැයි සැකකරන අවස්ථාවල (විටමින් ඌණතා තත්ත්ව - ඒ, බී, ගලගණ්ඩය වැනි) |